Australian Government
Department of Immigration and Border Protection

# Operation Sovereign Borders

## තොරතුරු පත්‍රිකාව

ඕස්ට්‍රේලියාවේ දේශසීමා ආරක්‍ෂා කිරීමට මෙන්ම පුද්ගල ජාවාරම වැළැක්වීමට ඕස්ට්‍රේලියානු රජයට දැඩි දේශසීමා ආරක්‍ෂක විධිවිධාන ඇත.

### Operation Sovereign Borders යනු කුමක්ද?

Operation Sovereign Borders (ස්වාධිපත්‍ය දේශසීමා මෙහෙයුම) යනු බෝට්ටු නැවැත්වීමට, අපරාධකරුවන්ට රැවටී පුද්ගලයන් මුහුද මැද තම ජීවිත අනතුරේ හෙළීමෙන් වැළැක්වීමට, සහ ඕස්ට්රේලියානු සංක්රමණ ව්‍යාපාරයෙහි සාධාරණත්වය රැකගැනීම සඳහා ආරක්ෂක අංශ විසින් මෙහෙයවනු ලබන දේශසීමා ආරක්ෂණ ක්රියාවලියකි.

ඔබ වීසා බලපත්රයක් නැතිව බෝට්ටුවකට නැග්ගොත් ඔබට ඕස්ට්රේලියාවට එන්න ලැබෙන්නෙ නෑ.

### සිරියාවේ සහ ඉරාකයේ අර්බුදවලින් අවතැන් වූ සරණාගතයන් 12000ක් නැවත පදිංචි කර ගැනීම සඳහා ඕස්ට්‍රෙලියාව කැප වී සිටියි. මෙයින් අදහස් වෙන්නේ ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රතිපත්තිය ලිහිල් වන බවද?

නෑ. සිරියාවේ සහ ඉරාකයේ අර්බුදකාරී වාතාවරණයෙන් මිදී පළා යන සරණාගතයන් නැවත පදිංචි කිරීම සඳහා වන ඕස්ට්රේලියානු රජයේ දැනුම්දීම මගින් පුද්ගලයන් නීතිවිරෝධී ලෙස බෝට්ටු මගින් ඕස්ට්රේලියාවට සංක්‍රමණය වීම වළක්වන ප්‍රතිපත්තිවලට කිසිදු බලපෑමක් ඇති නොවේ.

අතිරේක අවස්ථාවන් වෙන්කර ඇත්තේ UNHCR (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ) ලියාපදිංචි වී ඇති සහ දැනට ජෝර්දානයේ, ලෙබනනයේ සහ තුර්කියේ සිටින සරණාගතයන් පමණි. මෙම අවස්ථාවන් නීති විරෝධී ලෙස බෝට්ටු මගින් පැමිණෙන පුද්ගලයන් සඳහා ප්‍රදානය නොකෙරේ.

ඕස්ට්‍රේලියානු රජය තම දේශසීමා ආරක්ෂා කිරීම සඳහා කැප වී ක්‍රියා කරන අතර, නීතිවිරෝධී ලෙස බෝට්ටු මගින් පැමිණීමට තැත් කරන කවරෙකු හෝ ඒවා පැමිණෙන්නේ කොහි සිටද යන්න නොබලා නැවැත්වීමට ක්‍රියා කරනු ඇත.

### ඕස්ට්‍රේලියාවට අලුත් අගමැතිවරයෙක් ඇත. වීසා බලපත්‍ර නැතිව බෝට්ටු මගින් ඕස්ට්‍රේලියාවට ගමන් කරන පුද්ගලයන්ට මෙහි ඇති අදාළත්වය කුමක්ද?

ඕස්ට්‍රේලියාවේ අග්‍රාමාත්‍යවරයා වෙනස් වීම මගින් බෝට්ටු ආරක්ෂාකාරී ලෙස නැවත හරවා යැවීමේ ප්‍රතිපත්තියට හෝ සරණාගතභාවය පරීක්ෂා කිරීම සහ නැවත පදිංචිය සඳහා වෙනත් රටවලට යැවීමේ ප්‍රතිපත්තිය වෙනස් නොවේ.

නීතිවිරෝධී ලෙස බෝට්ටු මගින් ඕස්ට්‍රේලියාවට පැමිණීමට හෝ ඕස්ට්‍රේලියානු මුහුදු කළාපය හරහා නව සීලන්තයට යාමට තැත් කරන කවරෙකු හෝ වේවා සොයා ගැනීමට, නතර කිරීමට මෙන්ම ආපසු හරවා යැවීමටද ක්‍රියා කරනු ඇත.

මනුස් (පැපුවා නිව්ගිනියා) හෝ නාවුරු වල සිටින පුද්ගලයන් ඕස්ට්‍රේලියාව තුළ නැවත පදිංචි කර ගැනීමක් සිදු නොවන බව අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළේය-ඔවුන් කිසිදා ඕස්ට්‍රේලියාවට පැමිණෙන්නේ නැත.

## තවමත් ඕස්ට්රේලියාවට බෝට්ටු සාර්ථක ලෙස ළඟා වන බව මම අසා ඇත .මෙය ඇත්තක්ද?

නැත.මිනිස් ජාවාරම්කරුවන්ගේ බොරුවලට රැවටෙන්න එපා. 2014 වර්ෂය තුළ ඕස්ට්රේලියාවට පැමිණ ඇත්තේ එක බෝට්ටුවක් පමණක් පමණි, එම බෝට්ටුවේද සිටි සියලුම පුද්ගලයන් සරණාගතභාවය පරීක්ෂා කිරීම සඳහා නාවුරු රටට යවා ඇත

## ඉන්දුනීසියාවෙන් පැමිණෙන සරණාගතයන් නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් සිදුව ඇති වෙනස්කම් මොනවාද?

ඕස්ට්‍රේලියානු රජය ඉන්දුනීසියාවෙන් පැමිණෙන සරණාගතයන් නැවත පදිංචි කිරීමට අදාළ නීති වෙනස් කොට ඇත

ඔබ UNHCRහි ලියාපදිංචි වීම සඳහා ඉන්දුනීසියාවට ගමන් කළහොත් ඔබව ඕස්ට්‍රේලියාවේ නැවත පදිංචිය සඳහා සලකා බලනු නොලැබේ.

මේ නීති සියලු දෙනාටම බලපැවැත්වේ. කාටවත් සහනයක් හිමි නොවේ.

## මම දැනටමත් 2014 ජූලි 1 වෙනිදාට පෙර ඉන්දුනීසියාවේ ‘සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්’ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත්නම් සිදු වන්නේ කුමක්ද?

2014 ජූලි 1 වෙනිදාට පෙර ඉන්දුනීසියාවේ ‘සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්’ කාර්යාලයේ ලියාපදිංචි වී ඇති සරණාගතයින්ගෙන් සමහරක් ඕස්ට්‍රේලියාවේ නැවත පදිංචි කිරීම දිගටම **සිදු** කරමින් පවතී.

කොහොම වුණත් ඕස්ට්‍රේලියාවට භාර ගන්නා සරණාගතයින්ගේ ප්‍රමාණය සීමාසහිතයි - ඒ කියන්නේ ඕස්ට්‍රේලියාවේ පදිංචි කරන තුරු ඔබ ඉන්දුනීසියාවේ රැඳී සිටින කාලය (පොරොත්තු කාලය) තවත් දිගු විය හැකි බවයි.

## ඕස්ට්‍රේලියාව බෝට්ටු හරවා යවන්නේ ඉන්දුනීසියාවට පමණක් බව මම අසා ඇත. මෙය ඇත්තක්ද?

නෑ. පුද්ග්ලයන් පැමිණෙන්නේ මොන රටෙන් වුණත්, එන්නේ මොන පාරෙන් වුණත්, එහෙමත් නැත්නම් පිටත් වෙන්නේ මොන රටේ ඉඳල වුණත්, නීති විරෝධී විදිහට බෝට්ටුවෙන් ඕස්ට්රේලියාවට එන අයට ලැබෙන්නේ ප්රතිඵල දෙකක් විතරයි:

- එක්කෝ ඒ අයව නවත්වලා ආරක්ෂාකාරී විදිහට ඕස්ට්රේලියානු මුහුදු කළාපයෙන් බැහැර කෙරෙනු ඇති; නැත්නම්
- ඔවුන්ගේ සරණාගතභාවය පරීක්ෂා කිරීම සඳහා වෙනත් රටකට යැවෙනු ඇති.

## දැනටමත් මගේ ඥාතීන් ඕස්ට්‍රේලියාවේ සිටීනම් කුමක් වේද? ඥාතීන්හට දැනටමත් වීසා ඇත්නම් හෝ ඔවුන් එහි ස්ථිර පදිංචිකරුවන් හෝ පුරවැසියන් හෝ නම් මෙම නීතිවල වෙනසක් සිදුවේද?

ඔබේ පවුලේ අය දැනටමත් ඕස්ට්රේලියාවේ සිටියත් එමගින් කිසිදු වෙනසක් ඇති නොවේ. නීතිවිරෝධී ලෙස බෝට්ටුවෙන් ඕස්ට්රේලියාවට ඇතුළු වීමට තැත් කරන කාටත් මෙම නීති එක සේ බලපායි.

## මිනිස් ජාවාරම්කරුවන් කීවේ මට ඕස්ට්‍රේලියාවේ පදිංචි වීමට සුදුසුකම් ඇති බවයි.

මිනිස් ජාවාරම්කරුවන්ගේ බොරුවලට රැවටෙන්න එපා. මෙම අපරාධකරුවන් ඔබේ මුදල් සොරාගෙන ඔබගේත් ඔබේ පවුලේ උදවියගේත් ජීවිත නිකරුණේ අනතුරේ දමයි.

ඔබ වීසා බලපත්‍රයක් නොමැතිව නීතිවිරෝධී ලෙස බෝට්ටුවෙන් ඕස්ට්රේලියාවට පැමිණීමට උත්සාහ කරන්නේ නම්, ඔබ ඔබේත් ඔබේ පවුලේ අයගේත් ජීවිත ඇතුළු සියලු දේම නැතිකර ගැනීමේ අවදානමකට පත්වෙයි.

## හරවා යැවීමෙන් බේරී සරණාගතයින් ඕස්ට්‍රේලියානු භූමියට පැමිණියහොත් සිදුවන්නේ කුමක්ද?

ඕස්ට්රේලියාවේ දැඩි දේශසීමා ප්රතිපත්තියට නිසා කිසිම බෝට්ටුවකට අතරමගදී නැවැත්වීමකින් තොරව ගොඩබිමට ළඟා වීමට ලැබෙන්නේ නෑ.

පුද්ගලයන් නීතිවිරෝධී ලෙස බෝට්ටුවෙන් පැමිණෙන්නේ නම්, ඔවුන්ට කිසිසේත්ම ඕස්ට්රේලියාවේ පදිංචිය ලබාගැනීමට හැකි නොවනු ඇත. ඕස්ට්රේලියාවට එන මාර්ගය වසා ඇත.

## මේ ප්‍රතිපත්තිය කාන්තාවන්ට, ළමුන්ට සහ භාරකරුවෙකු නැති බාලවයස්කරුවන්ට අදාළ වෙනවද?

ඔව් මෙම නීති පවුල්, ළමයින්, භාරකරුවකු නැති බාලවයස්කරුවන්, අධ්යාපන සුදුසුකම් ඇති අය සහ පුහුණු ශ්රමිකයන් යන සියලු දෙනාටම අදාළ වේ. කාටවත් සහනයක් හිමි නොවේ.